# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1993/33 - 2016 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2016.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වන වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, කොස්වත්ත මංසන්ධිය පුළුල් කිරීම ඇතුළු නාගරික සංවර්ධන කටයුතු සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 නොවැම්බර් මස 16 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය තුළ, පල්ලේපත්තුව හේවාගම් කෝරලයේ, තලංගම උතුර ගමේ පිහිටි ඉඩමට අදාළව ඇඳ ඇති දළ සැලැස්මේ කැබලි අංක A සහ B වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් පර්. 18 (හෙක්. 0.0455) පමණ වූ කොස්වත්ත සමූපකාර පිරවුම්හල පිහිටි ඉඩමට හා කේ. අයි. යූ. කැම්පස් ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ.

**කොස්වත්ත සමූපකාර පිරවුම්හල පිහිටි ඉඩම**
**(කැබලි අංක A - ප්‍රමාණයෙන් පර්. 13)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. අයි. යූ. කැම්පස් ගොඩනැගිල්ල හා මාර්ග රක්ෂිතය හා දළ සැලැස්මේ කැබලි අංක B ; |
| *නැගෙනහිරට* | : | කඩුවෙල පාර ; |
| *දකුණට* | : | ඉඩම්ගොඩගේ අමර ජයලත් පෙරේරා හිමිකම් කියන තලංගම කොස්වත්ත පිහිටි වරිපනම් අංක 247 දරන ගොඩනැගිල්ල ; |
| *බටහිරට* | : | කේ. අයි. යූ. කැම්පස් ගොඩනැගිල්ල. |

1A - G 24579 — 17 (2016/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

**කේ. අයි. යූ. කැම්පස් ඉඩම**
**(කැබලි අංක B - ප්‍රමාණයෙන් පර්. 5)**

*උතුරට* : මාර්ග රක්ෂිතය ;
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය ;
*දකුණට* : කැබලි අංක A ;
*බටහිරට* : කේ. අයි. යූ. කැම්පස් ආයතනය හිමිකම් කියන ඉඩම.

12-202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.